WWW.OLEVELAPI.COM


සියලු ම හිමිකම් ඇවිරිණි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2018

# 11 - බුද්ධ ධර්මය

ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව**
**අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2018**

# 11 - බුද්ධ ධර්මය

## අවසාන ලකුණු ගණනය කිරීම

| | | | | |
|---|---|---|---|---|
| **I පත්‍රය** : | බහුවරණ ප්‍රශ්න 40 කි | = | (40 x 1) | **ලකුණු 40 යි** |
| **II පත්‍රය** : | 1 වැනි ප්‍රශ්නය | | කොටස් 10 කි කෙටි පිළිතුරු (10 x 2) | **ලකුණු 20 යි** |

2 වැනි ප්‍රශ්නය (2 - 7 තෙක් තෝරාගත් ප්‍රශ්න 04 කට)

| | | |
|---|---|---|
| i | ලකුණු 2 | |
| ii | ලකුණු 3 | |
| iii | ලකුණු 5 | ලකුණු 10 යි. |

3 වැනි ප්‍රශ්නය

| | | |
|---|---|---|
| i | ලකුණු 2 | |
| ii | ලකුණු 3 | |
| iii | ලකුණු 5 | ලකුණු 10 යි. |

4 වැනි ප්‍රශ්නය

| | | |
|---|---|---|
| i | ලකුණු 2 | |
| ii | ලකුණු 3 | |
| iii | ලකුණු 5 | ලකුණු 10 යි. |

5 වැනි ප්‍රශ්නය

| | | |
|---|---|---|
| i | ලකුණු 2 | |
| ii | ලකුණු 3 | |
| iii | ලකුණු 5 | ලකුණු 10 යි. |

6 වැනි ප්‍රශ්නය

| | | |
|---|---|---|
| i | ලකුණු 2 | |
| ii | ලකුණු 3 | |
| iii | ලකුණු 5 | ලකුණු 10 යි. |

7 වැනි ප්‍රශ්නය එක් කොටසකට ලකුණු 5 බැගින්
(ලකුණු 5 x 2 ) ලකුණු 10 යි.

**ලකුණු 40 යි.**
**මුළුලකුණු 100 යි.**

WWW.OLEVELAPI.COM

**අවසාන ලකුණු ගණනය කිරීම**

| | |
|---|---|
| I පත්‍රයට ලකුණු | = 40 |
| II පත්‍රයට ලකුණු | = 60 |
| **මුළු ලකුණු** | = 100 |



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න.
   ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

උදාහරණ : ප්‍රශ්න අංක 03

(i) ..................................................................... √ △ $\frac{4}{5}$
.....................................................................
.....................................................................

(ii) ..................................................................... 
..................................................................... √ △ $\frac{3}{5}$
.....................................................................

(iii) .....................................................................
..................................................................... √ △ $\frac{3}{5}$
.....................................................................

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

01. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දැක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න. කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන/අතිරේක ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.

WWW.OLEVELAPI.COM

02. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න. ලකුණු පරිවර්තනය කළ යුතු අවස්ථාවලදී පරිවර්තිත ලකුණු අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

මෙවර එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රයට අදාළ ලකුණු ලකුණු ලැයිස්තුවේ "I වන පත්‍රය" තීරුවේ ඇතුළත් කර අකුරෙන් ද ලියන්න. අදාළ විස්තර ලකුණු ඇතුළත් කර "II වන පත්‍රය" තීරුවේ II පත්‍රයේ අවසාන ලකුණු ඇතුළත් කරන්න. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු අදාළ තීරුවේ ඇතුළත් කළ යුතු ය.

**සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස I වන පත්‍රය II වන පත්‍රය හෝ III වන පත්‍රය තීරුවේ ඇතුළත් කළ යුතු ය. කිසිඳු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**

***



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

WWW.OLEVELAPI.COM

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව**
**අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2018**

# 11 - බුද්ධ ධර්මය

## සවිස්තර ලකුණු දීමේ පටිපාටිය

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති රාමුවක් සඳහා යෝජනා ඇතුළත් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2003 දෙසැම්බර් වාර්තාවේ දැක්වෙන පරිදි ජාතික අධ්‍යාපන පද්ධතිය මගින් ඉටුකරගත යුතු ජාතික පොදු අරමුණු 08 ක් වේ. එසේම මූලික නිපුණතා 07 ක් දැක්වේ. විධිමත් අධ්‍යාපනය මගින් මෙකී අරමුණු හා නිපුණතා සාක්ෂාත් කර ගැනීම අපේක්ෂිතය. මූලික නිපුණතා අතර පස් වැන්න ආගම හා ආචාර ධර්මයන්ට අදාළ නිපුණතාව වේ. එය පහත දැක්වේ.

5. ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතාව

"පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයන් උකහා ගැනීම හා ස්වීයකරණය."

පාසල් පද්ධතියේ ක්‍රියාත්මක සමස්ත විෂයමාලාව තුළින් පොදු අරමුණු හා මූලික නිපුණතා ඉටුකරගත යුතු අතර, ආගමික අධ්‍යාපනය තුළින් ඉහත දැක්වෙන පස්වන නිපුණතාව සුවිශේෂීව සපුරාගත යුතුව පවතී.

බුද්ධ ධර්මය විෂය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී එහි විෂය කරුණු ප්‍රායෝගිකත්වයට නැඹුරු කරවීම වර්තමාන යුගයට අත්‍යවශ්‍යව පවතී. වනපොත්කරණයෙන් විෂය කරුණු හදාරා විභාග සමත්වීම එකම අරමුණ නොවිය යුතු අතර, ඉන් ඔබ්බට ගොස් දෛනික ජීවිතයේ විවිධ ගැටලුවලට සාර්ථකව මුහුණ දීමටත් දහම් කරුණු භාවිතයට ගැනීමටත්, බුදු දහමේ ඉගැන්වෙන ශ්‍රේෂ්ඨ ධර්ම කරුණු අනුව තම ජීවිතය සාර්ථක කරගැනීමටත් සිසුන් යොමු කරලීම අත්‍යවශ්‍ය වේ. සමබර පෞරුෂයකින් හෙබි සැදැහැති බෞද්ධයකු දැයට දයාද කිරීම බුදු දහම ඉගැන්වීමේ මූලික අරමුණු විය යුතුය. බුද්ධ ධර්මය විෂය උගන්වන ගුරුවරයා මේ පිළිබඳ සුවිශේෂීව අවධානය යොමු කළ යුතුවේ.

නව විෂයමාලා ප්‍රතිසංස්කරණ යටතේ සැකසුන විෂයමාලාවක් පාසල් පද්ධතියට ඉදිරිපත් කෙරිණි. ඒ අනුව බුද්ධ ධර්මය විෂයයේ අරමුණු 07 ක් දැක්වේ. මෙම අරමුණු සපුරාලන අයුරින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සකසා ගත යුතුවේ. එම විෂය අරමුණු මෙසේයි.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

## විෂයයේ අරමුණු

01. ත්‍රිවිධ රත්නයේ ගුණ හැඳින, ශ්‍රද්ධාවෙන් කටයුතු කරන, නිවැරදිව ප්‍රායෝගික වතාවත්වල යෙදෙන දැහැමි දරු පරපුරක් බිහිකිරීම.

02. ජීවන ගමනේ දී මුහුණ දෙන අභියෝග ජය ගැනීමට සහ නිවැරදි ජීවන දර්ශනයක් ගොඩනගා ගැනීමට බුදු දහමෙහි මූලික ඉගැන්වීම් උපයෝගී කර ගැනීම පිණිස දරු පරපුරට මග පෙන්වීම.

03. සුපෞරුෂයක් ගොඩනගා ගැනීම උදෙසා බෝසත් චරිතය, බුද්ධ චරිතය හා සිව්වනක් පිරිසට අයත් ශ්‍රේෂ්ඨ චරිත ආදර්ශ කොට ගැනීම සඳහා මග පෙන්වීම.

04. ශ්‍රී ලාංකීය උරුමය දයාද කොට ගත් අභිමානවත්, වගකීමෙන් සහ වගවීමෙන් යුතු දරු පරපුරක් ගොඩනගා ගැනීම.

05. සිය ජීවන දර්ශනය ගොඩනගා ගැනීමේ දී ධම්මපද දේශනා සහ බෞද්ධ උපදේශ කාව්‍ය පදනම් කරගත් ඉගැන්වීම් චරිතායනයට මග පෙන්වීම.

06. මානසික ඒකාග්‍රතාවෙන් යුතු සුසමාහිත පෞරුෂයක් ගොඩනගා ගැනීම සඳහා භාවනාව ප්‍රගුණ කිරීමට යොමු කරවීම.

07. බෞද්ධ ශිෂ්ටාචාරයෙහි සුවිශේෂ අංග අධ්‍යයනය කොට, සහජීවනයෙන් කටයුතු කරන සිය අනන්‍යතාව රැක ගත් දරු පරපුරක් ගොඩනගා ගැනීම.

එසේම 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය තෙක් ද්විතීයික විෂය නිර්දේශය මූලික නිපුණතා 10 ක් යටතේ ගොනු කර ඇත. 6 ශ්‍රේණියේ සිට නිපුණතා මට්ටම් හා විෂය අන්තර්ගතය ක්‍රමයෙන් ගැඹුරින් හා පළලින් වැඩිවන ලෙස සර්පිලාකාර ක්‍රමයට ව්‍යාප්ත වන ලෙස සැකසී ඇත. බුද්ධ ධර්මය විෂයයේ නිපුණතා 10 පහත දැක්වේ.

## බුද්ධ ධර්මය විෂයයේ නිපුණතා

01). තෙරුවන් ගුණ හැඳින චරිතායනය කරයි.

02). ජීවන රටාව හැඩගසා ගැනීමට බෞද්ධ ඉගැන්වීම් හා ශ්‍රාවක, ශ්‍රාවිකා චරිත උපයෝගී කර ගනියි.

03). බෞද්ධ සාරධර්ම අගය කරමින් පිළිපදියි.

04). සුසමාහිත සමබර පෞරුෂයක් ගොඩනගා ගැනීමට කටයුතු කරයි.

05). ශ්‍රී ලාංකික බෞද්ධ අනන්‍යතාව සුරකිමින් සාමයෙන් හා සහජීවනයෙන් ක්‍රියා කරයි.

06). බුදු දහමට අනුව ජීවිතය හා ලෝකය හැඳිනගෙන ප්‍රඥාවන්ත ජීවිතයක් ගත කරයි.

07). ජීවී, අජීවී පරිසරයට හිතකාමීව හැසිරෙයි.

08). ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික බෞද්ධ උරුමය හැඳින එම උරුමය රැක ගැනීමට ක්‍රියා කරයි.

09). බෞද්ධ ආර්ථික හා රාජ්‍ය පාලන චින්තනය හැඳිනගෙන ඒ අනුව ක්‍රියා කරයි.

10). නිර්වාණය අරමුණු කොට ගෙන ආර්ය මාර්ගයේ ගමන් කරයි.

ඉහත දැක්වූ විෂය අරමුණු 07 පෙරදැරි කරගෙන නිපුණතා 10 සම්පූර්ණ වන ලෙස විෂය ඉගැන්වීම සාර්ථකව සිදු කළේ නම් සිසුන් තුළ යහපත් ගුණවගාවන් සිදුවනු ඇත. මෙම අවශ්‍යතාවන් ඉටුවන ලෙස ප්‍රායෝගිකත්වයට නැඹුරුව තක්සේරුකරණය පාසල් පාදකව සිදුවිය යුතුය. අ.පො.ස. (සා.පෙළ) විභාගය යනු විෂය දැනුම පිළිබඳ සමාප්තික ඇගයීම වේ.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

බුද්ධ ධර්මය විෂයය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වෙයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ මෙම ප්‍රශ්න පත්‍ර සැකසී ඇත. නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රියාවලියකට සිසුන් යොමු කිරීම නව විෂයමාලා ප්‍රතිසංස්කරණවලින් අපේක්ෂිතය. නිපුණතාවක් (Competency) යනු දැනුම (Knowledge) ආකල්ප (Attitude) කුසලතා (Skills) සහ යහ පුරුදු (Good Practices) යන මේවායේ සමස්ත එකතුවේ ප්‍රතිඵලය වෙයි. දිගුකාලීනව ලැබූ ඉගෙනුම් ක්‍රියාවලියේ අවසාන ඵලය නිපුණතාවන්ගෙන් පිරි සම්බර පෞරුෂයෙන් යුතු යහපත් පුරවැසියන් වේ. බුද්ධ ධර්මය විෂයය න්‍යායාත්මකව සහ ප්‍රායෝගිකව හැදෑරීම තුළින් ආගම විෂයයට අදාළ නිපුණතා ශිෂ්‍යයා සපුරා ගෙන ඇත යනු අපගේ විශ්වාසයයි. ඇගයීම් ක්‍රියාවලිය ද නිපුණතා පාදකව සිදුකරලීම සඳහා ප්‍රයත්න දරා ඇත. අදාළ නිපුණතාව ශිෂ්‍යයා අත් කර ගෙන තිබේද යන්න මැන බැලීමට උචිත අයුරින් බොහොමයක් වණු සැකසී ඇති බව සිහියේ තබාගත යුතුය.

මෙම විෂයය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වෙයි. පළමුවැන්න බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. දෙවැන්න කෙටි පිළිතුරු සැපයීමේ හා ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්නවලින් යුක්තය. මෙම ප්‍රශ්න පත්‍ර සඳහා ලකුණු වෙන් කොට ඇත්තේ මතු දැක්වෙන පරිදි වේ.

| | | |
|---|---|---|
| I | - පත්‍රය ලකුණු | 40 යි |
| II | - පත්‍රය ලකුණු | 60 යි |
| | **මුළු ලකුණු** | **100 යි** |

## බුද්ධ ධර්මය - I

01. අධ්‍යාපන ක්‍රියා පද්ධතිය මගින් ශිෂ්‍ය - ශිෂ්‍යාවන් තුළ දැනුම ආකල්ප හා කුසලතා ප්‍රවර්ධනය කිරීම මූලික අභිමතාර්ථය වෙයි. හුදු දැනුම පමණක් යහපත් ශිෂ්ට සම්පන්න පුරවැසියකු බිහි කිරීමට ප්‍රමාණවත් නොවේ. අංග සම්පූර්ණ පුරවැසියකු වීමට යහපත් ආකල්ප පෝෂණයක් ද තදනුබද්ධව සංවර්ධනය විය යුතු පුද්ගල කෞශල්‍යය ද අත්‍යාවශ්‍ය වෙයි. බුද්ධ ධර්මය විෂයය නිර්දේශය සැකසී ඇත්තේ දැනුම, අකල්ප හා කුසලතා වර්ධනය සඳහාය. ඒ සඳහා බුද්ධ ධර්මය පාඨග්‍රන්ථ මගින් විශාල ප්‍රයත්නයක් දරා ඇති අතර, ආකල්ප හා කුසලතා වර්ධනය විෂයය භාර ගුරු මහත්ම මහත්මීන්ගේ දායකත්වය මගින් පෝෂණය කිරීම අපේක්ෂිතය. බුද්ධ ධර්මය ආගමික විෂයය නිර්දේශයක් වුවද එමගින් හුදු දැනුම පමණක් මනිනු නොලැබේ. ප්‍රශ්න සැකසී ඇත්තේ දැනුම, ආකල්ප සහ කුසලතා විනිශ්චය කිරීම සඳහාය.

02. ප්‍රශ්න හතළිහකින් යුත් පළමුවැනි ප්‍රශ්න පත්‍රය සඳහා වෙන්ව ඇති කාලය පැයකි. ප්‍රශ්න පත්‍රයේ ම දැක්වෙන පිළිතුරු හතරකින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ලකුණු කිරීම විභාග අපේක්ෂකයා විසින් කළ යුතුය.

03. ප්‍රශ්නයට අදාළ පිළිතුර සේ පෙනෙන එහෙත් නිවැරදි පිළිතුරු නොවන පිළිතුරු තුනක් තිබේ. දී ඇති පිළිතුරු සටහනින් නිවැරදි පිළිතුර තෝරා ගැනීම සඳහා බුද්ධ ධර්මය මැනවින් හදාරා තිබිය යුතුය.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

04. අසා ඇති ප්‍රශ්න වහා අවබෝධකර ගැනීමේ ශක්තිය විභාග අපේක්ෂකයා සතු විය යුතුය. ප්‍රශ්නය නිසි ලෙස තේරුම් නොගැනීම අසාර්ථක පිළිතුරක් සැපයීමට හේතු විය හැකිය. ප්‍රශ්නය නිවැරදිව තේරුම් ගැනීමෙන් පසු නොපමාව නිවැරදි පිළිතුර කුමක්දැයි හඳුනාගෙන ලකුණු කළ යුතුයි.

05. පැයක පමණ කෙටි කාලයක් තුළ මේ සියලු කාර්යයන් ඉටු කළ යුතුව ඇති බැවින් ප්‍රශ්න පිළිබඳව නිරවුල් අවබෝධ ඥානය හා කාර්යක්ෂමභාවය සාර්ථක පිළිතුරු සැපයීමට බෙහෙවින් උපකාරවත් වේ.

06. සරල ප්‍රශ්න හතළිහකින් යුත් මේ ප්‍රශ්න පත්‍රයෙන් බලාපොරොත්තු වන්නේ බුද්ධ ධර්මය විෂයය සම්බන්ධ සාමාන්‍ය දැනීම පරීක්ෂාකර බැලීමය.

07. මේ ප්‍රශ්න පත්‍රයේ පිළිතුරුපත් ලකුණු කිරීමට පළමු පහත සඳහන් කරුණු කෙරෙහි පරීක්ෂකවරුන්ගේ දැඩි අවධානය යොමුවිය යුතුය.

i. නිවැරදි වරණය තේරීමේ දී අපේක්ෂකයා ලකුණු කොට ඇත්තේ එක් වරණයක් පමණක් දැයි බලන්න. එක් වරණයකට වඩා වැඩි සංඛ්‍යාවක් ලකුණු කොට ඇත්නම් එම පිළිතුර ඉරක් ඇඳ කපා හරින්න.

ii. සිදුරුපත් භාවිත කරන පරීක්ෂකවරුන් ප්‍රශ්නයේ අංකයත්, නිවැරදි පිළිතුරත් පැහැදිලිව පෙනෙන සේ සිය සිදුරුපත සකස්කර ගත යුතුය.

iii. සිදුරුපත් මගින් හරි වැරදි ලකුණු කිරීමේ දී නිවැරදි වරණය සඳහන් කොටුව මත ලකුණු කිරීමෙන් වලකින්න. පිළිතුරට අදාළ ප්‍රශ්න අංකය ඉදිරියෙහි හරි වැරදි ලකුණු කරන්න.

iv. නිවැරදි ලකුණු සංඛ්‍යාව ගණනය කොට අදාළ පේළිය යට මුළු සංඛ්‍යාව සටහන් කරන්න.

08. බුද්ධ ධර්මය ප්‍රශ්න පත්‍රයට අදාළ නිවැරදි උත්තර මතු දැක්වෙන සටහනෙහි පළවෙයි. නිවැරදි උත්තරයට එක් (01) ලකුණක් බැගින් හිමිවේ.

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

# බුද්ධ ධර්මය II

01. නව අධ්‍යාපන විෂයමාලා ප්‍රතිසංස්කරණ යටතේ විභාගය පැවැත්විණි. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය නිපුණතා පාදකව (Competency Based) ක්‍රියාකාරකම් පාදකව (Activity Based) සිදුවන අතරම ඇගයීම් හා තක්සේරුකරණ ක්‍රියාවලියද නිපුණතා පාදකව නිර්ණායක මූලිකව (Competency Based Criterion Reference Assessment and Evaluation) සිදුකිරීමට ප්‍රයත්න දරා ඇත. නිපුණතාවක් දැනුම ආකල්ප කුසලතා හා යහපුරුදුවලින් යුක්ත වෙයි. නිපුණතාවක් දිගුකාලීනව ඇතිවන්කි. ආගම හා සදාචාරයට අදාළ නිපුණතාවන් මෙන්ම බුද්ධ ධර්මය විෂයානුබද්ධ නිපුණතාවයන් ශිෂ්‍යයා ලබාගෙන තිබේද යන්න මැන බැලීම සඳහා ප්‍රශ්න පත්‍රය සැකසී ඇත.

බුද්ධ ධර්මය විෂය ක්ෂේත්‍රය පිළිබඳ අපේක්ෂකයා තුළ නිවැරදි අවබෝධය හා විෂය කරුණු විස්තරාත්මකව ඉදිරිපත් කිරීමේ හැකියාව ද, තමන් උගත් විෂය කරුණු ජීවිතය හා සමාජය සම්බන්ධ කොට විශ්ලේෂණය කිරීම සම්බන්ධයෙන් දක්වන නිපුණතා ද විමසා බැලීම මේ ප්‍රශ්න පත්‍රයේ අභිමතාර්ථය වෙයි.

02. බුද්ධ ධර්මය II ප්‍රශ්න පත්‍රයෙහි මතු දැක්වෙන උපදෙස් දී ඇත.

පළමුවන ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

★ පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු 10 ක් බැගින් ද හිමි වේ.

ඒ අනුව එක් එක් ප්‍රශ්නයට, කොටස්වලට ලකුණු ප්‍රදානය කිරීමේදී දිය යුතු ලකුණු ප්‍රමාණය මතකයෙහි තබා ගත යුතුය. පළමුවන ප්‍රශ්නයට ලකුණු (10 x 2) 20 කි. 02 සිට 06 දක්වා ප්‍රශ්නවල i කොටසට ලකුණු 2 ක් ද, ii කොටසට ලකුණු 3 ක් ද, iii කොටසට ලකුණු 5 ක් ද වශයෙන් ලකුණු 10 බැගින් හිමිවේ. 7 වන ප්‍රශ්නයේ කොටසකට ලකුණු 05 බැගින් කොටස් දෙකට ලකුණු (5 x 2) 10 කි. ඒ අනුව II පත්‍රයට ලකුණු (20 + 10 x 4 ) 60 කි.

03. බුද්ධ චරිතය, ශ්‍රාවක ශ්‍රාවිකා චරිත, බෞද්ධ චරිත කථා, බෞද්ධ ධර්මය, බෞද්ධ සමාජය, බෞද්ධාගමික චාරිත්‍ර, බෞද්ධ රාජ්‍ය පාලන මූලධර්ම, බෞද්ධ සාහිත්‍ය හා කලාශිල්ප, බෞද්ධ ශාසන ඉතිහාසය, ලක්දිව බුදුසසුන ආදිය පිළිබඳ විෂය නිර්දේශයට අදාළ කරුණු සම්බන්ධ සාමාන්‍ය ඥානය, විශේෂ ඥානය හා ප්‍රායෝගික අවබෝධය පරීක්ෂා කර බැලීම මේ ප්‍රශ්න පත්‍රයෙන් බලාපොරොත්තු වනු ලැබේ.

දෙවන පත්‍රයේ අංක 1 ප්‍රශ්නය ඉදිරිපත් කොට ඇත්තේ බුද්ධ ධර්මය මූලික විෂය කරුණු කෙටියෙන් ලියා දැක්වීම සඳහා කෙටි ප්‍රශ්න 10 කින් සමන්විත ප්‍රශ්නයක් ලෙසය. එහි දී ශිෂ්‍යයාහට නම් කිරීමක්, අර්ථ දැක්වීමක්, කෙටියෙන් හැඳින්වීමක් වැනි ප්‍රජානන හැකියා ලියා ඉදිරිපත් කිරීමට සිදුවේ. හිමි ලකුණු 20 කි. අංක 2 සිට 6 දක්වා ප්‍රශ්නවල i කොටසින් විෂයට අදාළ මූලික කරුණු පිළිබඳ අපේක්ෂකයා සතු දැනුම පරීක්ෂාවට ලක්කෙරෙයි. ii කොටසින් ඒ හා සම්බන්ධ කරුණු විග්‍රහ කොට ඇති අයුරු අපේක්ෂකයා මනාව වටහාගෙන ඇත්දැයි විමසුමට ලක්කෙරේ. iii කොටසින් අදාළ විෂය සම්බන්ධයෙන් අපේක්ෂකයාගේ විචාරාත්මක අවබෝධය හා නිදහස් චින්තනය පරීක්ෂාවට ලක් කරනු ලැබේ.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

මෙම කොටස් තුනෙන් iii කොටසට සපයා ඇති පිළිතුරු බොහෝවිට ගැඹුරු නොවීමට පුළුවන. එහෙත් අසා ඇති ප්‍රශ්න නිවැරදිව වටහා ගෙන අර්ථවත් කරුණු ඉදිරිපත් කර තිබේ නම් පිළිතුර කෙටි වුව ද සාධාරණ ලකුණු ප්‍රමාණයක් දීම සුදුසුය.

7 වන ප්‍රශ්නයේ මාතෘකා දෙකකට කෙටි සටහන් ලිවීම අපේක්ෂා කෙරේ.

04. ශිෂ්‍යයා නිවහල් චින්තනයට යොමු කිරීම නූතන අධ්‍යාපන ක්‍රියාවලියේ ප්‍රධාන පරමාර්ථය ලෙස සලකනු ලැබේ. එබැවින් බුද්ධ ධර්මය II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමේදී අදාළ පාඨ ග්‍රන්ථයන්හි අන්තර්ගතයට ම වහල් නොවී ස්වාධීනව ඉදිරිපත් කර ඇති නිවැරදි කරුණු පිළිබඳ ඔබේ අවධානය යොමු කිරීම මැනවි.

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**11 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2018 டிசெம்பர்
**General Certificate of Education (Ord. Level) Examination, December 2018**

බුද්ධ ධර්මය I, II
பௌத்தம் I, II
Buddhism I, II

2018.12.03 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## බුද්ධ ධර්මය I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** සිදුහත් කුමාරයාට ශිල්ප ශාස්ත්‍ර ඉගැන්වූ බමුණු පඬිවරයා
(1) කොණ්ඩඤ්ඤ නම් වේ. (2) කාලදේවල නම් වේ.
(3) සර්ව මිත්‍ර නම් වේ. (4) සුදත්ත නම් වේ.

**2.** අංගුලිමාල, ආලවක කතාවලින් ප්‍රකට වන්නේ බුදුරජාණන් වහන්සේ තුළ පැවති
(1) අසරණ සරණ ගුණයයි. (2) පුරිසදම්ම සාරථී ගුණයයි.
(3) යථාවාදී තථාකාරී ගුණයයි. (4) තාදී ගුණයයි.

**3.** සිදුහත් බෝසතාණන් 'කිං කුසලගවේසීව' සිටි අවධියේ පළමුව සත්‍ය සොයා ගියේ
(1) ආලාරකාලාම වෙත ය. (2) කාලදේවල වෙත ය.
(3) භග්ගව වෙත ය. (4) උද්දකරාමපුත්ත වෙත ය.

**4.** බුදුරජාණන් වහන්සේට වේරඤ්ජාවේදී 'යව' නැමැති කටුක ආහාරය වළඳමින් කල් ගෙවීමට සිදු වූයේ
(1) දහවන වස් කාලයේදී ය. (2) දොළොස්වන වස් කාලයේදී ය.
(3) පසළොස්වන වස් කාලයේදී ය. (4) විසිඑක්වන වස් කාලයේදී ය.

**5.** ගිලානෝපස්ථානය බුද්ධ චරිතයෙන් ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවූ අවස්ථාවකට නිදසුනක් වන්නේ
(1) මට්ටකුණ්ඩලී කථා පුවත ය. (2) රජ්ජුමාලා කථා පුවත ය.
(3) සෝපාක කථා පුවත ය. (4) පූතිගත්තතිස්ස කථා පුවත ය.

**6.** සිදුහත් කුමාරයා සරණපාවාගත් භද්දකච්චානා කුමරියගේ පියතුමා වූයේ
(1) උදේන රජතුමා ය. (2) කෝලිය රජතුමා ය. (3) සුප්‍රබුද්ධ රජතුමා ය. (4) බිම්බිසාර රජතුමා ය.

**7.** "දානං සීලං ච නෙක්ඛම්මං" යන ගාථාවෙන් විස්තර වන්නේ
(1) දස පාරමිතා පිළිබඳව ය. (2) දස රාජධර්ම පිළිබඳව ය.
(3) දස සක්විතිවත් පිළිබඳව ය. (4) දස පින් කිරියවත් පිළිබඳව ය.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

8. සම්මා සම්බුද්ධ, පච්චේක බුද්ධ, අරහන්ත බුද්ධ යන තුන් ආකාරයට සත්‍ය අවබෝධ කරන බව ධර්මයේ දැක්වේ. එම තුන් ආකාරය
(1) තුන්තරා බෝධිය නම් වේ. (2) ත්‍රිවිධ චෛත්‍ය නම් වේ.
(3) ත්‍රිවිධ රත්නය නම් වේ. (4) ත්‍රිශික්ෂා නම් වේ.

9. දාන පරමත්ථ පාරමිතා යනුවෙන් හැඳින්වෙන්නේ
(1) තමා සතු භෞතික දෑ දන්දීමයි. (2) ශරීර අවයව දන්දීමයි.
(3) අඹු දරුවන් දන්දීමයි. (4) තම ජීවිතය දන්දීමයි.

10. යමක් ආරම්භ කිරීමේදී, ඉදිරිපත්වීමේදී හා නිරතවීමේදී නොපසුබස්නා උත්සාහයෙන් කටයුතු කිරීමේ වටිනාකම විස්තර වන්නේ
(1) සත්‍ය පාරමිතාවෙනි. (2) නෙක්ඛම්ම පාරමිතාවෙනි.
(3) අධිෂ්ඨාන පාරමිතාවෙනි. (4) වීර්ය පාරමිතාවෙනි.

11. නිවන් පසක් කිරීමට අවශ්‍ය මනා වූ පිළිවෙත් රකිනා බැවින් මහා සංඝරත්නය
(1) සුපටිපන්න නම් වේ. (2) උජුපටිපන්න නම් වේ.
(3) ආහුනෙය්‍ය නම් වේ. (4) පාහුනෙය්‍ය නම් වේ.

12. සතර සංග්‍රහ වස්තුවට අයත් **නොවන** කරුණ වන්නේ
(1) දානය යන්නයි. (2) සීලය යන්නයි.
(3) ප්‍රිය වචනය යන්නයි. (4) සමානාත්මතාව යන්නයි.

13. පංචස්කන්ධය හෙවත් නාම රූප හේතු කොට ගෙන ෂඩායතන (ආයතන හය) ඇති වන බව හේතුඵල ධර්මයෙහි සඳහන් වේ. එම ආයතන හය
(1) රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ, උපධි නම් වේ.
(2) රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධර්ම නම් වේ.
(3) පඨවි, ආපෝ, තේජෝ, වායෝ, ආකාස, ඉන්ද්‍රිය නම් වේ.
(4) චක්ඛු, සෝත, ඝාන, ජිව්හා, කාය, මන නම් වේ.

14. භද්දාලි සූත්‍රයෙහි දැක්වෙන පරිදි ආහාරයෙහි ප්‍රමාණය දැන අනුභව කිරීමෙන් ලැබෙන යහපත් ප්‍රතිඵලයක් **නොවන්නේ**
(1) රෝගාබාධ අඩුවීමයි. (2) සුවපහසු පැවැත්මයි.
(3) කාය බලය ලැබීමයි. (4) මානසික බලය ලැබීමයි.

15. "කුසලාකුසල කර්ම රැස්කිරීම හේතු කොට ගෙන ප්‍රතිසන්ධි සිත පහළ වේ." යන්න සඳහන් අනුලෝම පටිච්ච සමුප්පාද ඉගැන්වීම වන්නේ
(1) "අවිජ්ජා පච්චයා සංඛාරා" යන්නයි. (2) "සංඛාර පච්චයා විඤ්ඤාණං" යන්නයි.
(3) "විඤ්ඤාණ පච්චයා නාමරූපං" යන්නයි. (4) "උපාදාන පච්චයා භවෝ" යන්නයි.

16. "තමාට අහිත වූ අයහපත් දේ කිරීම ඉතා පහසු ය. වැඩදායක යහපත් දේ කිරීම අපහසු ය." යන අදහස ඇතුළත් ධම්මපද ගාථාවේ මුල් දෙපදය දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) "යෝච වස්සසතං ජීවේ - දුස්සීලෝ අසමාහිතෝ"
(2) "නතං කම්මං කතං සාධු - යං කත්වා අනුතප්පති"
(3) "සුකරානි අසාධූනි - අත්තනෝ අහිතානිච"
(4) "අත්තනාව කතං පාපං - අත්තනා සංකිලිස්සති"

17. උපතිස්ස පිරිවැජියා ඇසූ ප්‍රශ්නයට පිළිතුර ලෙස "යේ ධම්මා හේතුප්පභවා - තේසං හේතුං තථාගතෝ ආහ" යනාදී ගාථාව ප්‍රකාශ කළේ
(1) කොණ්ඩඤ්ඤ හිමි ය. (2) භද්දිය හිමි ය.
(3) මහානාම හිමි ය. (4) අස්සජි හිමි ය.

18. බුදුදහමේ දැක්වෙන පරිදි යමක් ඇතිවීමට තවත් දෙයක් හෝ දේවල් කිහිපයක් බලපායි. මෙම අදහස ප්‍රකට වන බෞද්ධ සංකල්පය වන්නේ
(1) පටිච්චසමුප්පාදයයි. (2) අහේතු අප්පච්චයවාදයයි.
(3) අකිරියවාදයයි. (4) පුබ්බේකත හේතුවාදයයි.



WWW.OLEVELAPI.COM
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

19. යම් සේ ගසක මුල ශක්තිමත්ව නොගැලවී පවතින්නේ ද ඒතාක් කල් එම ගස නැවත නැවත ලියලන්නා සේ පුද්ගලයා ද නැවත නැවත සසර දුකට පත්වන්නේ

(1) වෛරය හේතු කොට ගෙන ය. (2) තණ්හාව හේතු කොට ගෙන ය.
(3) මානය හේතු කොට ගෙන ය. (4) ථීනමිද්ධය හේතු කොට ගෙන ය.

20. ත්‍රිශික්ෂාවේ සමාධි ශික්ෂාවට අයත් **නොවන** මාර්ග අංගය වන්නේ

(1) සම්මා ආජීව යන්නයි. (2) සම්මා වායාම යන්නයි.
(3) සම්මා සති යන්නයි. (4) සම්මා සමාධි යන්නයි.

21. ලොව නොවෙනස් වන කිසිදු පදාර්ථයක් නැති බව අවබෝධ කර ගැනීම පිණිස ඉවහල් වන බෞද්ධ භාවනා ක්‍රමය වන්නේ

(1) ආනාපානසති භාවනාවයි. (2) මෛත්‍රී භාවනාවයි.
(3) සමථ භාවනාවයි. (4) විදර්ශනා භාවනාවයි.

22. තමාට හැකියාව තිබියදීත් මහලුවියට පත් මව්පියන්ට නොසැලකීමේ ආදීනව දැක්වෙන සූත්‍ර දේශනාව

(1) මංගල සූත්‍රයයි. (2) පරාභව සූත්‍රයයි.
(3) සිගාලෝවාද සූත්‍රයයි. (4) පත්තකම්ම සූත්‍රයයි.

23. සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන පරිදි දෙමාපියන් විසින් දූ දරුවන්ට ඉටුකළ යුතු යුතුකම් අතරට අයත් **නොවන්නේ**

(1) ඔවුන් වරදින් මුදවා ගැනීමයි. (2) ඔවුන් යහපත් කටයුතුවල යෙදවීමයි.
(3) සුදුසු කල්හි සම්පත් පවරාදීමයි. (4) නිවසෙහි වගකීම් පැවරීමයි.

24. "කවරෙක් සත්‍ය කියන්නේ ද කවරෙක් අසත්‍ය කියන්නේදැයි සැකය, විමතිය මතු කිරීම සුදුසු ය. සුදුසු තැන්හි ම ඔබ තුළ සැක ඉපදී තිබේ." යන ප්‍රකාශය තුළින් කියැවෙන්නේ

(1) සිතීමේ හා විමසීමේ නිදහස පිළිබඳව ය. (2) මහණ බමුණන්ගේ ස්වභාවය පිළිබඳව ය.
(3) සත්‍ය හා අසත්‍ය ප්‍රකාශ පිළිබඳව ය. (4) ආගමික සහනශීලීතාව පිළිබඳව ය.

25. උත්සාහයෙන්, දැත දෙපයේ මහන්සියෙන්, දහදිය හෙළා ධාර්මික රැකියාවක නිරතවීම ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ දැක්වෙන්නේ

(1) උට්ඨාන සම්පදා නමිනි. (2) ආරක්ඛ සම්පදා නමිනි.
(3) කල්‍යාණ මිත්තතා නමිනි. (4) සමජීවිකතා නමිනි.

26. මරණින් මතු පළමු ආත්මභාවයේදී හෙවත් ඊළඟ භවයේදී විපාක දෙන කර්ම

(1) දිට්ඨධම්මවේදනීය කර්ම නම් වේ. (2) උපපජ්ජවේදනීය කර්ම නම් වේ.
(3) අපරාපරියවේදනීය කර්ම නම් වේ. (4) අහෝසි කර්ම නම් වේ.

27. ජනක කර්මයට බාධා පමුණුවන, එහි බලය හීන කරවන කර්මය

(1) කටත්තා කර්ම නම් වේ. (2) උපත්ථම්භක කර්ම නම් වේ.
(3) උපපීඩක කර්ම නම් වේ. (4) උපඝාතක කර්ම නම් වේ.

28. තිදොරින් සිදු කරන අකුසල කර්ම අතර කාය කර්ම ගණයට අයත් **නොවන** කරුණ වන්නේ

(1) ප්‍රාණඝාත යන්නයි. (2) අදත්තාදාන යන්නයි.
(3) කාමමිත්‍යාචාර යන්නයි. (4) අභිධ්‍යා යන්නයි.

WWW.OLEVELAPI.COM

29. පළමුවන ධර්ම සංගායනාවේ මූලිකත්වය ගෙන ක්‍රියා කළේ

(1) සබ්බකාමී තෙරණුවෝ ය. (2) මොග්ගලී පුත්ත තිස්ස තෙරණුවෝ ය.
(3) මහා කාශ්‍යප තෙරණුවෝ ය. (4) පාර්ශ්ව තෙරණුවෝ ය.

30. "බුදුන් සරණ යෙමියි බුත්සරණ යායුතු" යනුවෙන් සෑම ඡේදයක් අවසානයේ දක්වමින් බුදුගුණ වර්ණනා කරමින් 'අමෘතාවහ' නම් ග්‍රන්ථය රචනා කළ කතුවරයා

(1) ගුරුළුගෝමී පඬිතුමා ය. (2) විද්‍යා චක්‍රවර්තී පඬිතුමා ය.
(3) බුද්ධපුත්‍ර හිමි ය. (4) ධර්මසේන හිමි ය.

31. බුද්ධ ප්‍රතිමා නිර්මාණය හා වන්දනය ජනප්‍රියවීමත් සමග ප්‍රතිමාවල ආරක්ෂාව සඳහා ගෘහයක් ඉදි වූ අතර එය

(1) චේතියඝර නමින් හැඳින්වේ. (2) පධානඝර නමින් හැඳින්වේ.
(3) පටිමාඝර නමින් හැඳින්වේ. (4) බෝධිඝර නමින් හැඳින්වේ.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

32. පාලකයෙකු යුක්තිය හා සාධාරණත්වය ඉටු නොවන ලෙස ස්ව කැමැත්ත මත අගතිගාමීව කටයුතු කිරීම
   (1) ඡන්දය ලෙස හැඳින්වේ. (2) ද්වේෂය ලෙස හැඳින්වේ.
   (3) භය ලෙස හැඳින්වේ. (4) මෝහය ලෙස හැඳින්වේ.

33. තමා උපමා කොට අනුන් ගැන සිතන්නට උගන්වන ධම්ම පරියාය බුදුදහමේ හැඳින්වෙන්නේ
   (1) ලෝකාධිපති ධම්ම ලෙස ය. (2) අත්තාධිපති ධම්ම ලෙස ය.
   (3) ධම්මාධිපති ධම්ම ලෙස ය. (4) අත්තූපනායික ධම්ම ලෙස ය.

34. ගර්භයේ හැඩය කළයක ස්වරූපයෙන් ගොඩනංවන ලද ස්තූප හැඳින්වෙන්නේ
   (1) ධාන්‍යාකාර ස්තූප ලෙසයි. (2) ඝණ්ඨාකාර ස්තූප ලෙසයි.
   (3) ඝටාකාර ස්තූප ලෙසයි. (4) පද්මාකාර ස්තූප ලෙසයි.

35. තෙවැනි ධර්ම සංගායනාවේ ප්‍රතිඵල ගණයට අයත් **නොවන්නේ**
   (1) දුසිල් මහණුන් සසුනින් නෙරපීම ය.
   (2) නවරට සසුන් පිහිටුවීම ය.
   (3) අභිධර්ම පිටකයට කථාවත්ථුප්‍රකරණය එක්වීම ය.
   (4) ධර්ම විනය රැකගෙන යාමට භාණක පරපුරකට පැවරීම ය.

36. එවකට පිරිහී තිබූ ආගම දහම හා බෞද්ධ අධ්‍යාපනය නගා සිටුවීමේ අරමුණින් දේශ හිතෛෂී පිරිස් සමග එක් වී පරම විඥානාර්ථ බෞද්ධ සමාගම පිහිටුවනු ලැබුවේ
   (1) හික්කඩුවේ සුමංගල හිමියන් විසිනි. (2) මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් විසිනි.
   (3) හෙන්රි ස්ටීල් ඕල්කට්තුමන් විසිනි. (4) අනගාරික ධර්මපාලතුමන් විසිනි.

37. වැලිවිට සිරි සරණංකර සංඝරාජ මාහිමිපාණන් වහන්සේ විසින් රචිත ග්‍රන්ථ අතරට ඇතුළත් **නොවන** ග්‍රන්ථය වන්නේ
   (1) මුනිගුණාලංකාරයයි. (2) බුදුගුණාලංකාරයයි.
   (3) සාරාර්ථ සංග්‍රහයයි. (4) සතර බණවර සන්නයයි.

38. දුටුගැමුණු මහරජතුමන් විසින් ඉදිකරනු ලැබූ ආගමික ගොඩනැගිලි පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.
   (1) ලෝවාමහාපාය, රුවන්වැලිසෑය, අභයගිරිය
   (2) රුවන්වැලිසෑය, මිරිසවැටිය, ජේතවනය
   (3) මිරිසවැටිය, රුවන්වැලිසෑය, ලෝවාමහාපාය
   (4) රුවන්වැලිසෑය, ථූපාරාමය, මිරිසවැටිය

39. මහනුවර රාජධානි යුගයට අයත් සිතුවම් දක්නට ලැබෙන ස්ථානය වන්නේ
   (1) හිඳගල විහාරයයි. (2) ගල් විහාරයයි.
   (3) තිවංක පිළිමගෙයයි. (4) මැදවල විහාරයයි.

40. බුදුරජාණන් වහන්සේගේ දකුණු අකු ධාතුව තැන්පත් කොට දෙවනපෑතිස් රජතුමා ගොඩනැගූ ස්තූපය වන්නේ
   (1) මහියංගන චෛත්‍යයයි. (2) ථූපාරාම දාගැබයි.
   (3) ගිරිහඬු සෑයයි. (4) රන්කොත් වෙහෙරයි.

* *

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

WWW.OLEVELAPI.COM

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2018
க.பொ.த (சா.தர)ப் பரீட்சை - 2018

| විෂයය අංකය<br>பாட இலக்கம் | 11 | විෂයය<br>பாடம் | බුද්ධ ධර්මය |
|---|---|---|---|

## I පත්‍රය - පිළිතුරු
## I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 1 | 21. | 4 | 31. | 3 |
| 02. | 2 | 12. | 2 | 22. | 2 | 32. | 1 |
| 03. | 1/3 | 13. | 4 | 23. | 4 | 33. | 4 |
| 04. | 2 | 14. | 4 | 24. | 1 | 34. | 3 |
| 05. | 4 | 15. | 2 | 25. | 1 | 35. | 4 |
| 06. | 3 | 16. | 3 | 26. | 2 | 36. | 3 |
| 07. | 1 | 17. | 4 | 27. | 3 | 37. | 2 |
| 08. | 1 | 18. | 1 | 28. | 4 | 38. | 3 |
| 09. | 4 | 19. | 2 | 29. | 3 | 39. | 4 |
| 10. | 4 | 20. | 1 | 30. | 2 | 40. | 2 |

WWW.OLEVELAPI.COM

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තර පත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

| | | | |
|---|---|---|---|
| නිවැරදි පිළිතුරු සංඛ්‍යාව<br>சரியான விடைகளின் தொகை | 25 / 40 | I පත්‍රයේ මුළු ලකුණු<br>பத்திரம் I இன் மொத்தப்புள்ளி | 25 / 40 |



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

## II පත්‍රය - පිළිතුරු

1. (i) සිදුහත් බෝසතාණන් වහන්සේ බුද්ධත්වයට පත්වීමෙන් පසුව කළ ප්‍රථම උදාන වාක්‍යයට අයත් ගාථාවේ මුල් පද දෙක ලියන්න.
   (ii) සුද්ධෝදන රජතුමා විසින් සිදුහත් කුමාරයාට වාසය කිරීමට ඉදිකර දුන් මාලිගා **තුන** නම් කරන්න.
   (iii) සතර පෙර නිමිති ලියා දක්වන්න.
   (iv) "ලාභෝ අලාභෝ අයසෝ යසෝ ච" යන ගාථාවෙන් කියවෙන ධර්ම කරුණු හඳුන්වන පොදු නාමය ලියන්න.
   (v) වණ්ණුපථ ජාතකයෙන් ප්‍රකට වන්නේ සිදුහත් බෝසතාණන් සම්පූර්ණ කළ කිනම් පාරමිතාව ද?
   (vi) "ඒහි පස්සිකෝ" යන දහම් ගුණයෙහි අර්ථය ලියන්න.
   (vii) පරාභව සූත්‍රයේ දැක්වෙන පුද්ගලයාගේ පිරිහීමට හේතු වන කරුණු **දෙකක්** ලියන්න.
   (viii) බුදුදහමේ උගන්වන 'අත්ථි සුඛය' යන්න කෙටියෙන් පහදන්න.
   (ix) සේඛියා ධර්මවලට අනුව ආහාර පරිභෝජනයේදී පිළිපැදිය යුතු යහපත් පුරුදු **දෙකක්** ලියන්න.
   (x) "ඇත ධූලින් වැසී ගිය ඇත්රජ යැ. මෑත සවණක් ඝණ බුදුරැසින් සැදී ගිය බුදුරජාණෝ යැ..." යන පාඨය ඇතුළත් ධර්ම ග්‍රන්ථය හා එහි කතුවරයා නම් කරන්න.

i. "අනේක ජාති සංසාරං - සන්ධාවිස්සං අනිබ්බිසං"

*(ලකුණු 02 යි)*

ii රම්‍ය, සුරම්‍ය, සුභ

*(ලකුණු 02 යි)*

iii. මහල්ලෙක්, ලෙඩෙක්, මළමිනිසෙක් හා පැවිදි රුවක්

*(ලකුණු 02 යි)*

iv. අටලෝ දහම/ අෂ්ට ලෝක ධර්මය

*(ලකුණු 02 යි)*

v. වීර්‍ය පාරමිතාව/ විරිය පාරමිතාව/ විරිය පාරමී/ විරිය පාරමිතා

*(ලකුණු 02 යි)*

vi. එව බලව/ එන්න බලන්න/ පැමිණ බලන්න/ දහමෙහි ඇති විවෘත බව

*(ලකුණු 02 යි)*

vii. ධර්මයට අකමැති වීම
අසත්පුරුෂයන් ප්‍රිය වීම
සත්පුරුෂයන් ප්‍රිය නොකිරීම
අසත්පුරුෂ ධර්මයට ප්‍රිය කිරීම
නිතර නිදන සුලුබව (නිද්දාසීලී)
කතාවෙන්ම දවස ගෙවීම (සභාසීලී)
උත්සාහයෙන් තොරවීම
අලසකම
ක්‍රෝධ කරන බව
මහලුවියට පත් දෙමාපියන්ට නොසැලකීම
මහණ බමුණන් බොරුවෙන් රැවටීම
රස බොජුන් තනිව වළඳීම
මානයෙන් උදම් වී ඥාතීන් පහත් කොට සැලකීම
ස්ත්‍රීන් කෙරෙහි ලොල්වීම
සුරාව කෙරෙහි ලොල්වීම
සූදු කෙළියෙහි ලොල්වීම
වෛශ්‍යාවන් සේවනය කිරීම
පරඹුවන් කරා යාම
වයසක මිනිසෙකු ළාබාල තරුණියක සරණ පාවා ගැනීම
නාස්තිකාර ස්ත්‍රියක හෝ පුරුෂයකු ගෘහ ආධිපත්‍යයෙහි තැබීම
ධනයෙන් හීන, තෘෂ්ණාවෙන් යුතු ක්ෂත්‍රියයකු රජකම පැතීම

*(ලකුණු 02 යි)*



WWW.OLEVELAPI.COM
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

viii. අත්ථි සුඛය යනු ධාර්මිකව උපයා සපයා ගත් ධනයක් තමන්ට ඇතැයි සතීමෙන් ඇතිවන සතුටයි.

*(ලකුණු 02 යි)*

ix. ආහාර ළං කිරීමට කලින් මුඛය විවෘත නො කිරීම
ආහාර ගන්නා විට අත මුඛයට ඇතුළු නොකිරීම
ආහාර මුඛයෙහි තබාගෙන කථා නොකිරීම
මුඛය විවෘත කොට ඒ තුළට ආහාර විසි නොකිරීම
බත් පිඩ කටින් කඩා අනුභව නොකිරීම
අත ගසා දමමින් ආහාර නොගැනීම
දිව මුවින් පිටතට ඇද ආහාර නොගැනීම
සුරු සුරු හඬ නගමින් ආහාර නොගැනීම
අත ලෙවකමින් ආහාර නොගැනීම
පාත්‍රය/ පිඟාන ලෙවකමින් ආහාර නොගැනීම
තොල් ලෙවකමින් ආහාර නොගැනීම
ඉඳුල් සහිත අතින් පැන් බඳුන නොගැනීම
වඳුරන් මෙන් හක්කේ තබාගෙන ආහාර අනුභව නොකිරීම

*(ලකුණු 02 යි)*

x. බුත්සරණ - විද්‍යා චක්‍රවර්ති පඬිවරයා

*(ලකුණු 02 යි)*

***එක් කොටසකට ලකුණු දෙක බැගින් ලකුණු 20 යි.***

**2.** (i) බුදුරජාණන් වහන්සේ ස්වාභාවික පරිසරය ආශ්‍රිතව වස් විසූ ස්ථාන **දෙකක්** නම් කරන්න.
(ii) උන්වහන්සේ පරිසරයේ සුන්දරත්වය අගය කළ ආකාරය කෙටියෙන් දක්වන්න.
(iii) පාරිසරික සම්පත් ආරක්ෂා කිරීමෙන් ලැබිය හැකි ප්‍රයෝජන මොනවාදැයි පැහැදිලි කරන්න.

| | | | |
|---|---|---|---|
| i | පළමුවන වස් කාලය | - | බරණැස ඉසිපතනාරාමය |
| | දෙවන, තෙවන හා සිව්වන වස්කාල | - | වේළුවනාරාමය |
| | පස්වන වස් කාලය | - | විශාලා මහනුවර කූඨාගාර ශාලාව |
| | හයවන වස් කාලය | - | මකුල පර්වතය |
| | අටවන වස් කාලය | - | භේෂකලා පර්වතය/ හේෂකලා පර්වතය |
| | දහවන වස් කාලය | - | පාරිලෙය්‍ය වනය |
| | දහතුන, දහ අට, දහනවය වස් කාල | - | චාලිය පර්වතය |

*(ලකුණු 02 යි)*



WWW.OLEVELAPI.COM
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

ii. බුදුරජාණන් වහන්සේ පරිසරයේ සුන්දරත්වය විරාගීව වර්ණනා කොට ඇත.

- රජගහනුවර හා ඒ අවට පරිසරය වර්ණනා කොට ඇත.

  රජගහනුවර සිත් අලවන සුලුය. නිග්‍රෝධය සිත්කලුය. චෞර ප්‍රපාතය සිත්කලුය. වේභාර පර්වතය පාර්ශ්වයෙහි වූ සප්තපර්ණී ගුහාව ද සිත්කලුය. ඉසිගිලි පර්වතයේ කාලශිලාව ද සිත්කලුය.................................

- විශාලා මහනුවර උදේන,ගෝතමක, සත්තම්බක සාරන්දද ආදී රමණීය ස්ථාන රැසක් ද වර්ණනා කොට ඇත.

- උරුවෙල් දනව්ව සේනානි නම් නියම් ගමද වර්ණනාවට ලක් කර ඇත.
  මේ භූමි භාගය රමණීය ය. වන ලැහැබ ප්‍රිය ජනකය......................

***පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු ප්‍රදානය කරන්න. කරුණු තුනක්වත් දක්වා තිබිය යුතුය.***

***(ලකුණු 03 යි)***

iii.

* අප අවට ඇති පරිසරයේ සියලුම සම්පත් මිනිසාගේ යහපත පිණිසම හේතුවේ.

* බුදු දහම පාරිසරික සම්පත් ආරක්ෂා කර ගැනීම සඳහා වටිනා උපදෙස් රාශියක් ලබාදෙන අතර, එයින් අපට ලබාගත හැකි ප්‍රයෝජන ද පෙන්වා දී ඇත.

* ජල සම්පත ආරක්ෂා කිරීම පිළිබඳව බුදුදහම ප්‍රමුඛතාවක් දක්වයි. ජලයට මුත්‍රා කිරීම, කෙළ ගැසීම වරදක් බවත්, එය භික්ෂූන් වහන්සේලා නොකළ යුත්තක් බවත් පෙන්වා දී ඇත. පිරිසිදු පානීය ජලය ලබා ගැනීමෙන් නිරෝගී ජීවිතයක් ගත කළ හැකිය.

* පිරිසිදු වාතය ද පාරිසරික සම්පතකි. පිරිසිදු පරිසරයක් පවත්වා ගන්නා ආකාරය චුල්ලවග්ග පාළියේ වත්තක්ඛන්ධකයෙහි විස්තර කොට ඇත.

* සත්ත්වයාට ප්‍රධාන වශයෙන් ආහාර ලබා දෙන්නේ තුරුලතාය. වෘක්ෂ ලතා සංරක්ෂණය සම්බන්ධයෙන් බුදු දහමෙහි උපදෙස් ලබා දී ඇත. බුදුරජාණන් වහන්සේ විසින් වනාන්තර වැවීම දිවා රෑ පිං වැඩෙන පිංකමක් ලෙස ද දේශනා කොට ඇත.

* බෞද්ධ උපදෙස් පිළිපදිමින් පාරිසරික සම්පත් ආරක්ෂා කරන්නේ නම් වර්තමානයේ අපට මුහුණදීමට සිදුව ඇති ගංවතුර, නායයාම්, ශ්වසන ආබාධ ආදී පීඩාවන්ගෙන් මිදී සුව පහසු ජීවිතයක් ගත කිරීමට හැකි වනු ඇත.

***පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු විනිශ්චය කරන්න***

***(ලකුණු 05 යි)***



WWW.OLEVELAPI.COM
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

3. (i) "තංච කම්මං කතං සාධු" යන ධම්මපද ගාථාව සම්පූර්ණ කර ලියන්න.
(ii) එම ගාථාවේ තේරුම ලියන්න.
(iii) පුද්ගල ජීවිතයේ සාර්ථකත්වයට උපදෙස් සපයන ග්‍රන්ථයක් ලෙස ධම්මපදය ඇගයීමට ලක් කරන්න.

i. තංච කම්මං කතං සාධු
යං කත්වා නානුතප්පති
යස්ස පතීතෝ සුමනෝ
විපාකං පටිසේවති

**ගාථාව සම්පූර්ණයෙන් ලියා ඇත්නම් ලකුණු 02 ප්‍රදානය කරන්න.**
**අක්ෂර වින්‍යාසය නොසලකන්න.**

*(ලකුණු 02 යි)*

ii. යමක් කිරීමෙන් පසුතැවීමට සිදු නොවේද, යමක විපාකය ප්‍රීතියෙන් හා සොම්නසින් යුතුව විඳිය හැකි වේද එබඳු ක්‍රියාවල නිරත විය යුතුය.

හෝ

සිහිකරන විට පසු තැවීමට හේතු නොවන, සතුට දනවන ක්‍රියාවන්හි නිරත විය යුතුය

**ගාථාවේ සම්පූර්ණ අදහස තිබේනම් ලකුණු 03 දෙන්න.**

**(ලකුණු 03 යි)**

iii * පුද්ගල ජීවිතය සාර්ථකත්වයට පත් කර ගැනීම සඳහා උපදෙස් සපයන, ප්‍රායෝගිකව අදාළ කර ගත හැකි මා හැඟි ග්‍රන්ථයක් ලෙස ධම්මපදය සඳහන් කළ හැකිය.

* ධම්මපදයේ එන ගාථා ධර්මයන්හි ඇතුළත් උපදෙස් මගින් හොඳ නරක හඳුනා ගැනීමට මඟ පෙන්වයි.
* සිතේ සන්සුන් බව ඇති කර ගැනීම හා වීර්යවන්තව ක්‍රියා කොට ජීවිතය ජය ගැනීමට උපදෙස් ලබා දෙයි.
* සහජීවනයෙන් ක්‍රියා කිරීමට අල්පේච්ඡ බව ඇති කර ගැනීමට චාම් ජීවිතයක් ගත කිරීමට ඉතා වටිනා උපදෙස් ලබා දෙයි.
* අධික අශාවන්ගෙන්, අපේක්ෂාවන්ගෙන් තොරව ධනය උපයාගෙන සාර්ථක මිනිසෙකු වීමට උපදෙස් ලබා දෙයි.
* සමාජගත ජීවිතයේදී ඇසුරු කළ යුතු හා නොකළ යුතු පුද්ගලයන් හඳුනා ගැනීමට මඟ පෙන්වයි.
* පුද්ගල පෞරුෂය නිවැරදි ක්‍රියාකාරකම්වලින් ගොඩ නගා ගැනීමට ඉතා වටිනා උපදෙස් ලබා දෙයි.
* සමස්තයක් ලෙස ධම්මපදයෙන් මෙලොව ජීවිතය සාර්ථක කර ගැනීමට මෙන්ම පරලොව ජීවිතය සාර්ථක කර ගැනීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන බව සඳහන් කර තිබීම අවශ්‍ය වේ.

**පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු ප්‍රදානය කරන්න.**

**(ලකුණු 05 යි)**

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

4. (i) දස රාජධර්මවලට අයත් කරුණු අතුරෙන් **දෙකක්** ලියන්න.
(ii) ඉහත (i) හි දැක්වූ කරුණුවලින් එක් කරුණක් පැහැදිලි කරන්න.
(iii) "මහජනතාවට යහපත් සේවාවක් සැපයීමට දස රාජධර්ම ඉවහල් වේ." විස්තර කරන්න.

i.

1. දානය (දානං)
2. සීලය (සීලං)
3. පරිත්‍යාගය (පරිච්චාගං)
4. ඍජුබව (අජ්ජවං)
5. මෘදු බව (මද්දවං)
6. තපස (තපං)
7. අක්‍රෝධය ( අක්කෝධෝ)
8. අවිහිංසාව (අවිහිංසා)
9. ඉවසීම (ඛන්ති)
10. අවිරෝධතාව/ විරුද්ධ නොවීම (අවිරෝධතා)

***නිවැරදි කරුණු 02 ක් නම් කර තිබේ නම් ලකුණු 02 ක් ලබා දෙන්න.***

***(ලකුණු 02 යි)***

ii. (1) දානය

රටවැසියාගේ ආර්ථික සුරක්ෂිතතාව තහවුරු කරලීම සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය ලබාදීම දානය යන්නෙන් අර්ථවත් කෙරේ. කෘෂි කර්මාන්තය, වෙළෙඳාම ආදී ජීවන වෘත්තීන් ආරම්භ කොට ක්‍රියාත්මක කර ගෙන යාමට අවශ්‍ය පහසුකම් සපයා දීමයි.

(2) සීලය

කායික, වාචසික සංවරයෙන් යුක්තවීම, සදාචාර සම්පන්න අයෙකු වීම, ප්‍රතිපත්තිගරුක වීම හා අන් අයට ආදර්ශවත් වීම සීලය යි. චාරිත්‍ර වාරිත්‍ර ගැන සැලකිලිමත්ව ක්‍රියා කිරීම මූලික වශයෙන් සීලයට අයත් වේ.

(3) පරිත්‍යාගය

පාලකයා තම රටවැසියාගේ යහපත සඳහා තම කාලය, ශ්‍රමය, ධනය සුව පහසුව යනාදිය කැප කිරීම පරිත්‍යාගයයි.

(4) ඍජු බව

නිවැරදි තීන්දු තීරණ ගැනීමට බාධාවන දේශපාලන හිතවත්කම් ඥාති සබඳතා පසෙක තබා සතර අගතියෙන් තොරව යුක්තිය හා සාධාරණත්වය වෙනුවෙන් අවශ්‍ය කටයුතු කිරීම



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

(5) මෘදු බව

මෘදු බව යනු හදවතේ මොළොක් බවයි. ජනතාවට මුහුණපෑමට සිදුවන විවිධ ආර්ථික හා සාමාජික ගැටලු හා අභියෝගවලට කාරුණික හැඟීමෙන් ක්‍රියා කිරීමයි

(6) තපස

මනා ඉන්ද්‍රිය සංවරයක් හා තැන්පත් සිතකින් ජනතා අපේක්ෂා ඉටුවන පරිදි ක්‍රියා කිරීමයි

(7) අක්‍රෝධය

ක්‍රෝධ චේතනාවෙන් තොරව කටයුතු කිරීමයි. සියලු රටවැසියන් තම දරුවන් ලෙස සිතා වෛරයෙන්, ක්‍රෝධයෙන්, කෝපයෙන් තොරව ක්‍රියා කිරීමයි.

(8) අවිහිංසාව

කායික හා මානසික හිංසාවෙන් තොරව මිනිසා ඇතුළු සෑම සත්ත්ව කොට්ඨාසයක් කෙරෙහි ම කටයුතු කිරීමයි.

(9) ඉවසීම

දුරදිග සිතාබලා, ක්ෂණික තීරණවලට නොඑළඹ ඉවසිලිවන්තව කටයුතු කිරීමයි.

(10) අවිරෝධතා

විවිධ අදහස් හා මතවාද දරන පිරිස් සමග මධ්‍යස්ථව ගැටුම්වලින් තොරව කටයුතු කිරීම.

***එක් කරුණක් කෙටියෙන් පැහැදිලි කර තිබේ නම් ලකුණු 03 දෙන්න.***

WWW.OLEVELAPI.COM

***(ලකුණු 03 යි)***

iii.

ජනතා හිතවාදී පාලකයෙකු විසින් අනුගමනය කළ යුතු මූලධර්ම අතරට දස රාජ ධර්ම අයත්වේ. ජනතාව හා පාලකයන් අතර පැවැතිය යුත්තේ පිය පුතු සබඳතාවට සමාන ලෙන්ගතු සබඳතාවකි. ඒ සඳහා දස රාජ ධර්ම පිටුබලයක් සපයයි.

* දානය යනු ආර්ථික වශයෙන් රට වැසියන් සුරක්ෂිත කිරීමට කටයුතු කිරීමයි. ඒ තුළින් සමාජය ස්වයංපෝෂිත වෙයි.
* පාලකයා පරිත්‍යාගශීලි වීම නිසා ජනතා සුභ සාධනය දියුණු කළ හැකි වෙයි.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

* පාලකයා සිල්වත් වීම, ඉන්ද්‍රිය සංවරයෙන්, අක්‍රෝධයෙන්, අවිහිංසාවෙන් ක්‍රියා කිරීම නිසා බියෙන්, සැකෙන් තොරව සහජීවනයෙන් හා සාමකාමීව ජීවත්වීමේ හැකියාව ලැබීම.
* ඍජුව ක්‍රියා කිරීම ඉවසීම හා මෘදු බව හේතු කොට ගෙන ජනහිතකාමී තීරණ ගැනීමේ හැකියාව ලැබේ. ඒ හරහා යුක්තිය හා සාධාරණත්වය රජයන සමාජ වටපිටාවක් ගොඩනගා ගත හැකිය.
* රටේ ජීවත්වන සමස්ත ජනයාගේ අදහස්වලට ගරු කිරීම හේතුවෙන් ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු වේ.

*පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු විනිශ්චය කරන්න.*

*(ලකුණු 05 යි)*

5. (i) මහින්දාගමනය සිදු වූ ආකාරය සැකෙවින් දක්වන්න.
(ii) ලක්දිව බුදුසමයේ ව්‍යාප්තියට දෙවනපෑතිස් රජතුමාගෙන් සිදු වූ මෙහෙය අගය කරන්න.
(iii) මහින්දාගමනයෙන් අප ලැබූ දායාද පිළිබඳ විස්තරයක් කරන්න.

i. ධර්මාශෝක අධිරාජයාගේ ධර්මදූත සේවාවේ ප්‍රතිඵලයක් ලෙස සම්බුද්ධ පරිනිර්වාණයෙන් 236 වන වර්ෂයෙහි එනම් දෙවන පෑ තිස් රජතුමාගේ පළමු රාජ්‍ය වර්ෂයෙහි මහින්දාගමනය සිදුවිය. මිහිඳු මාහිමි ප්‍රමුඛ දූත පිරිස පොසොන් පුරපසළොස්වක් පොහෝ දින මිහින්තලේ අම්බස්ථල පර්වතයට වැඩම කොට ලක්දිව වැසියාට ධර්ම දේශනා කළහ.

*කෙටියෙන් පැහැදිලි කිරීමක් තිබේ නම් ලකුණු 02 ප්‍රදානය කරන්න.*
*(ලකුණු 02 යි)*

ii.
* ලක්දිව බුදු සමයේ ව්‍යාප්තිය සඳහා දෙවන පෑතිස් රජතුමාගෙන් අමිල මෙහෙයක් සිදුවිය.
* රජතුමා පළමුව බුදු දහම වැළඳගෙන රට වැසියන්ට ද බුදු දහම වැළඳ ගැනීම සඳහා ආදර්ශයක් සැපයීම
* මහමෙව්නා උයන සඟ සතුකොට පූජා කොට එහි විනය සීමාව පිහිටුවා මහා විහාරය ඉදිකොට සම්බුද්ධ ශාසනයේ පදනම දැමීම.
* අරිට්ඨ කුමාරයා ඇතුළු පිරිස ශාසනයට ඇතුළත් කොට භික්ෂු සමාජය ඇති කිරීමට කටයුතු කිරීම.
* අනුලා දේවිය ඇතුළු කාන්තාවන්ට පැවිදිවීම සඳහා සංඝමිත්තා තෙරණිය ගෙන්වා ගැනීමට කටයුතු සැලැස්වීම.
* ශ්‍රී මහා බෝධීන් වහන්සේ දඹදිව සිට මෙරටට ගෙන්වා ගනු ලැබීම.
* ලක්දිවට බුදු සසුන පැමිණීමෙන් පසු ඉදිකළ පළමු චෛත්‍යය වන ථූපාරාමය ගොඩනැංවීම.

*කරුණු 03 ක් වත් ඇතුළත් පිළිතුරකට ලකුණු 03 ලබා දෙන්න.*
*(ලකුණු 03 යි)*



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

iii.

මිහිඳු මහ රහතන් වහන්සේ ප්‍රධාන ධර්මදූතයන් වහන්සේලාගේ සම්ප්‍රාප්තියත් සමගම ලංකා ශාසන ඉතිහාසයේ රන් අකුරින් ලියැවුණු සමාරම්භය සනිටුහන් විය. ශ්‍රී ලාංකේය ජනතාවට බුදු දහමේ ආශීර්වාදය ලැබුණි. එසේම ඒ දහමින් ඔප් නැංවුණු ශ්‍රේෂ්ඨ දායාද රාශියක් උරුම විය. ඒ අතර,

* මහා විහාරය කේන්ද්‍ර කොට ගත් වෙහෙර විහාර ඇති වීම
* භික්ෂු සමාජය හා භික්ෂුණී සමාජය ඇති වීම
* මහා විහාරය කේන්ද්‍ර කොට ගත් අධ්‍යාපන ක්‍රියාවලියක් ආරම්භ වීම
* ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩමවා රෝපණය කිරීම
* ප්‍රතිමා කලාව හා වාස්තු විද්‍යාත්මක නිර්මාණ බිහි වීම
* චිත්‍ර, මූර්ති, කැටයම් ගෘහ නිර්මාණ ආදී කලා අංග බිහිවීම
* භාෂාව හා අක්ෂර මාලාවක් ලැබීම
* සිංහල හා පාලි ගද්‍ය පද්‍ය සාහිත්‍යයක් ලැබීම
* දැහැමි රාජ්‍ය පාලන ක්‍රමයක් ඇති වීම
* දැහැමි ආර්ථික ප්‍රතිපත්තියක් ලැබීම
* දැහැමි පුද, සිරිත් ඇති වීම
* උසස් සාරධර්ම හා ගුණ ධර්ම ලැබීම

***පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.***

*(ලකුණු 05 යි)*

**6.** (i) දෙවන ධර්ම සංගායනාව පැවැත්වීමට තුඩුදුන් හේතු සැකෙවින් දක්වන්න.
(ii) එම ධර්ම සංගායනාව පැවැත් වූ ස්ථානය, රාජානුග්‍රහය ලබා දුන් පාලකයා හා සහභාගි වූ භික්ෂූන් ගණන ලියන්න.
(iii) දෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල ගෙනහැර දක්වන්න.

i. දෙවන ධර්ම සංගායනාව පැවැත්වීමට තුඩුදුන් හේතුව වන්නේ විශාලා මහනුවර වැසි වජ්ජිපුත්තක භික්ෂූන් දස වස්තුවක් ඉදිරිපත් කිරීමයි. අකැප වූ කරුණු දහයක් කැප යයි එම භික්ෂූහු ප්‍රකාශ කොට ක්‍රියාවට නැංවූහ. මෙය විනිශ්චය කිරීමේ අවශ්‍යතාවක් ඇති විය. එසේම ධර්ම විනය පිරිසිදුව පවත්වාගෙන යාමේ අවශ්‍යතාව ද ඇති විය.

*(ලකුණු 02 යි)*

ii. විශාලා මහනුවර වාලුකාරාමයේදී/ විශාලා මහනුවරදී/ වාලුකාරාමයේදී

කාලාශෝක රජතුමා

හත් සියයයි/ 700

*(ලකුණු 03 යි)*



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

iii. දෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල සමූහයක් වූ අතර ඒවා ශාසන ඉතිහාසය කෙරෙහි බල පෑ ආකාරය ශාසන ඉතිහාසය තුළින් ප්‍රකට වේ.

* දස වස්තුව අකැප යැයි ප්‍රතික්ෂේප වීම.
* විනය විරෝධීව කටයුතු කළ භික්ෂූන්ට නිග්‍රහ කිරීම
* පළමුවන ධර්ම සංගායනාවේදී ඇති කර ගත් සම්මුතිය අනුව ශික්ෂාපද ලිහිල් නොකොට ඉදිරියට පවත්වාගෙන යාමට තීරණය කිරීම.
* මෙතෙක් පැවති ථේරවාදී භික්ෂු පරපුර ථේරවාද හා මහාසංඝික ලෙස බෙදී පසුව අටළොස් නිකායක් බවට සංවර්ධනය වීම
* දස වස්තුව පිළිගත් දුර්මතධාරී වජ්ජිපුත්තක භික්ෂූන් දස දහසක් සසුනින් ඉවත් කර සංඝ සංශෝධනයක් සිදු කිරීම

**ආදී කරුණු තුනක් වත් ඇතුළත් වන සේ විස්තර කර ඇත් නම් ලකුණු 05 ක් ලබා දෙන්න.**

**(ලකුණු 05 යි)**

**7.** පහත සඳහන් මාතෘකා අතුරෙන් **දෙකකට** කෙටි සටහන් ලියන්න.

(i) රේරුකානේ චන්ද්‍රවිමල මහනාහිමි
(ii) කල්‍යාණ මිත්තතා
(iii) සද්ධර්ම රත්නාවලිය
(iv) බුදුපිළිමය

i. <u>රේරුකානේ චන්ද්‍රවිමල මහ නාහිමි</u>

රයිගම් කෝරළයේ රේරුකාන ගමෙහි උපත ලද රූබෙල් ගුණවර්ධන කුමරු බුරුම ජාතික යු. විනයාලංකාර හිමියන් වෙතින් රේරුකානේ චන්ද්‍රවිමල නමින් පැවිදි විය. පසුව බුරුම රටට වැඩම කොට ත්‍රිපිටකය හා බුරුම භාෂාවත් මනාව ඉගෙන ගෙන එහිදී ම උපසම්පදාව ලබා පසු කලකදී ලංකාවට වැඩම කළේය.

ඉතා චාම්, අල්පේච්ඡ ජීවිතයක් ගත කළ උන්වහන්සේ ඉතා නිහතමානීව දිවි ගෙවූ බව ප්‍රකට ය.

WWW.OLEVELAPI.COM

බෞද්ධයාගේ දහම් දැනුම වර්ධනය කිරීම සඳහා ග්‍රන්ථ රැසක් ම උන්වහන්සේ අතින් රචනා විය. පාරමිතා ප්‍රකරණය, පොහොය දිනය, ධර්ම විනිශ්චය යන ග්‍රන්ථ ඉන් කිහිපයකි.

1997 ජූලි 04 වන දින අපවත් වූ උන්වහන්සේගේ අදාහන කටයුතු ද ඉතා චාම් ආකාරයට සිදු කෙරිණි.

*පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.*

**(ලකුණු 05 යි)**



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

ii. **කල්‍යාණ මිත්තතා**

කල්‍යාණ මිත්තතා යනු යහපත් මිත්‍රයන් ඇසුරු කිරීමයි. මෙහිදී සැළකිලිමත් විය යුත්තේ මිත්‍රයාගේ වයස හෝ තරාතිරම නොව ගතිගුණ කෙරෙහිය. ඔවුන් සතු සද්ධා, සීල, චාග, පඤ්ඤා යන ගුණ ධර්ම තම ජීවිතයට සමීප කර ගැනීම කල්‍යාණ මිත්‍රයන්ගේ ආශ්‍රය තුළින් අපේක්ෂා කර ගත යුතු ප්‍රමුඛ කරුණයි.

***පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.***

(ලකුණු 05 යි)

iii. **සද්ධර්ම රත්නාවලිය**

"සද්ධර්මය නමැති මිණිකැට ඇමිණූ මාලය" යන අරුත ගෙන දෙන සද්ධර්ම රත්නාවලිය කෘතිය ධර්මසේන නම් හිමි නමකගේ නිර්මාණයකි. දඹදෙණි සාහිත්‍ය යුගයේදී මෙම ග්‍රන්ථය රචනා කොට ඇත. ධම්මපදයට ලියූ අටුවාව වන පාලි ධම්මපදට්ඨකථාව ඇසුරින් මෙම ග්‍රන්ථය සම්පාදනය කර ඇතත් එහි පදානුගත පරිවර්තනයක් නොවන බව ප්‍රකටය. ගැමි වහරට සමීප වූ උපමා උපමේයයන් බහුලව යොදා ගනිමින් පොදු බෞද්ධ මහජනයාගේ යහපත උදෙසා මෙම ග්‍රන්ථය සම්පාදනය කර ඇත. ඉන් ගැමි ජීවිතයේ සුවඳ වහනය වේ.

**පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.**

(ලකුණු 05 යි)

iv. **බුදු පිළිමය**

බුද්ධ ප්‍රතිමාව ක්‍රි.පූ පළමුවන සියවසේ කණිෂ්ක රාජ්‍ය සමයේදී නිර්මාණය වී ඇතැයි සැලකේ. ග්‍රීක රෝම කලාවේ ආභාසය ලබා ගන්ධාරයේදී බුද්ධ ප්‍රතිමා නිර්මාණය කර ඇති බව විශාරදයින්ගේ මතයයි. හිටි පිළිම, හිඳි පිළිම, සැතපෙන පිළිම හෙවත් ඔත් පිළිම වශයෙන් පිළිම වර්ග තුනක් වේ. ත්‍රිවිධ චෛත්‍යය අතුරින් තුන් වැන්න බුද්ධ ප්‍රතිමාව වේ. බුදු පිළිමයේ පසු කාලීන සංවර්ධනයේදී විවිධ මුද්‍රා හා ආසන නිර්මාණය විය

***පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.***

(ලකුණු 05 යි)



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....